ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01. ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

පුවත්පත් නිවේදනය

නිකුත් කළේ	ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
දිනය	2019 අප්‍රේල් මස 25 දින

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2018 වසර සඳහා වන වාර්ෂික වාර්තාව

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 35 වැනි වගන්තියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ 69 වැනි වාර්ෂික වාර්තාව මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් ගරු මුදල් අමාත්‍ය මංගල සමරවීර මහතා වෙත පිළිගන්වන ලදී.

[ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් 2018 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව ගරු මුදල් අමාත්‍ය මංගල සමරවීර මහතා වෙත පිළිගැන්වීම. ගරු මුදල් රාජ්‍ය අමාත්‍ය එරාන් වික්‍රමරත්න මහතා, මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ මුදල් මණ්ඩල සාමාජික ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා, සහකාර අධිපතිනි ස්වර්ණා ගුණරත්න මහත්මිය, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර මහතා සහ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය පී.කේ.ජී. හරිශ්චන්ද්‍ර මහතා ද ඡායාරූපයේ වෙති.]

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවෙන් පිළිබිඹු වන 2018 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

2018 වසරේදී පහළ උද්ධමනකාරී වාතාවරණයක් මධ්‍යයේ සාමාන්‍ය වර්ධනයක් වාර්තා කළ ශ්‍රී ලංකා ආර්ථිකය, ගෝලීය සහ දේශීය බාධාවන්ට ලක්වීමේ අවදානම් සහගත බව වැඩි වශයෙන් පිළිබිඹු කළේය. 2018 වසරේදී මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) වර්ධනය පසුගිය වසරේ වාර්තා කළ සියයට 3.4 ට සාපේක්ෂව සියයට 3.2 ක අගයක් වාර්තා කරන ලදී. සේවා අංශයේ ක්‍රියාකාරකම්වල සිදු වූ සියයට 4.7 ක වර්ධනය සහ කෘෂිකාර්මික කටයුතු යථා තත්ත්වයට පත්වෙමින් එම අංශයේ වාර්තා කළ සියයට 4.8 ක වර්ධනය මේ සඳහා වැඩි දායකත්වයක් සපයන ලදී. ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් කටයුතුවල පසුබෑම හේතුකොටගෙන වසර තුළදී කර්මාන්ත අංශයේ වර්ධනය සියයට 0.9 ක් දක්වා සැලකිය යුතු ලෙස මන්දගාමී විය. ද.දේ.නි. ගණනය කිරීමේ වියදම් ප්‍රවේශය අනුව, පරිභෝජන වියදම් සහ ආයෝජන වියදම් යන දෙඅංශයම 2018 වර්ෂයේ ආර්ථික වර්ධනය සඳහා දායක විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආයෝජන පෙර වසරේ වාර්තා කළ සියයට 28.8 ට සාපේක්ෂව සියයට 28.6 ක් ලෙස පැවතුණු අතර ඉතුරුම් - ආයෝජන පරතරය වසර තුළදී තවදුරටත් පුළුල් වූයේ එහි හිඟය සපුරා ගැනීම සඳහා විදේශීය සම්පත් මත වූ රැඳියාව ඉහළ යෑම පිළිබිඹු කරමිනි. 2018 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකය එ.ජ. ඩොලර් බිලියන 88.9 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර ඒක පුද්ගල ද.දේ.නි. එ.ජ. ඩොලර් 4,102 ක් ලෙස පෙර වසරට වඩා මදක් පහළ අගයක් වාර්තා කළේය. ආර්ථික කටයුතුවල මධ්‍යස්ථ වර්ධනය හමුවේ, සේවා වියුක්ති අනුපාතිකයේ සුළු ඉහළ යෑමක් හා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතයේ පහළ යෑමක් වසර තුළදී නිරීක්ෂණය විය.

ගෝලීය සහ දේශීය සාධක හේතුවෙන් ආර්ථිකයේ විදේශීය අංශය වසර පුරා විවිධ විචලනයන්ට භාජනය විය. ගෝලීය වශයෙන්, විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදයෙහි මුදල් ප්‍රතිපත්තිය ඉතා පහළ ප්‍රතිපත්ති පොලී අනුපාත මට්ටමක සිට සාමාන්‍යකරණය වීම හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ තත්ත්වයන් දැඩි වූ අතර, එමගින් නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් වෙතින් ප්‍රාග්ධන ගලා යෑම් සිදු වූ අතර, විශේෂයෙන්ම ද්විත්ව හිඟයක්, එනම් අයවැය හිඟය සහ විදේශීය අංශයේ ජංගම ගිණුමේ හිඟය සහිත ආර්ථිකයන්හි විනිමය අනුපාතික මත ඉහළ පීඩනයක් ඇති කළේය. ශ්‍රී ලංකාවට ද, විශේෂයෙන්ම 2018 වසරේ අප්‍රේල් මස මැද සිට මෙම අභියෝගවලට මුහුණ පෑමට සිදු වූ අතර, වසරේ සිව්වන කාර්තුවේදී දේශපාලන අවිනිශ්චිතතා පැවතීම මෙන්ම ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් අගයන් පහළ යෑම හේතුවෙන් එම තත්ත්වය තවදුරටත් තීව්‍ර විය. දේශීය වශයෙන් සැලකීමේදී නාමික වශයෙන් සැලකිය යුතු අගයක් වාර්තා කරමින් අපනයන ආදායම් වර්ධන වේගයට වඩා ආනයන වියදම් වර්ධන වේගය ඉහළ යෑමත් සමඟ

ඉතිහාසයේ පළමු වතාවට වෙළඳ හිඟය, එ.ජ. ඩොලර් බිලියන 10 ඉක්මවීය. සේවා අපනයන සැලකිය යුතු ලෙස ඉහළ ගියද, වෙළඳ හිඟය වැඩිවීම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් මන්දගාමීවීම සහ විදේශීය ණය මත පොලී ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් ජංගම ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.2 ක් දක්වා පුළුල් විය. 2018 වසරේදී මෙතෙක් වාර්තා වූ ඉහළම විදේශීය සෘජු ආයෝජන මට්ටම මෙන්ම විශේෂයෙන්ම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම් හරහා විදේශීය ණය ලබා ගැනීම් ද මූල්‍ය ගිණුමේ ශේෂයට සහාය විය. මෙම ප්‍රවණතාවල සමස්ත ප්‍රතිඵලයක් ලෙස ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය, හිඟයක් ලෙස වාර්තා විය. 2018 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කළ වෙළඳපොළ මත පදනම් වූ විනිමය අනුපාතික ප්‍රතිපත්තිය මධ්‍යයේ රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීමට ඉඩ හැරිය නමුත්, විශේෂයෙන්ම විශාල ප්‍රාග්ධන ගලා යෑමක් සිදුවන අවස්ථාවලදී සහ අනිසි සමපේක්ෂණ කටයුතු හේතුවෙන් වෙළඳපොළෙහි අධික උච්චාවචන ඇතිවන අවස්ථාවලදී මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් විය. පුළුල් වෙමින් පැවති වෙළඳ හිඟයට පිළියමක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන සීමා කිරීම සඳහා තීරු බදු ඉහළ නැංවීම, ආන්තික තැන්පතු අවශ්‍යතා පැනවීම, තෝරාගත් ණය කාණ්ඩ කිහිපයක් සඳහා වටිනාකම මත වූ ණය අනුපාතික දැඩි කිරීම සහ සහනදායී බලපත්‍ර මත වාහන ආනයනය සඳහා ණයවර ලිපි නිකුත් කිරීම අත්හිටුවීම වැනි ක්‍රියාමාර්ග රාශියක් ගනු ලැබීය. මෙම ක්‍රියාමාර්ග සහ ගෝලීය මූල්‍ය වෙළඳපොළෙහි අහිතකර තත්ත්වයන් යම්තාක් දුරකට සමනයවීමේ ප්‍රතිඵලයක් ලෙස 2018 වසර අවසානයේදී සහ 2019 වසර ආරම්භයේදී ගෙවුම් තුලනය සහ විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩනය පහළ ගිය අතර 2019 වසරේ පළමු කාර්තුවේදී ශ්‍රී ලංකා රුපියල ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය. මෙමගින් පසුගිය වසරේදී විනිමය අනුපාතිකයේ සිදු වූ සැලකිය යුතු අවප්‍රමාණය වීම කිසියම් දුරකට යථා තත්ත්වයට පත් කිරීමට හැකි විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදල) විස්තීර්ණ ණය පහසුකම යටතේ සාකච්ඡා 2019 වසරේ පෙබරවාරි මස සිට නැවත ආරම්භ වීම සහ ඒ සම්බන්ධයෙන් නිලධාරී මට්ටමේ එකඟතාවයකට එළඹීම ද, ආයෝජන සඳහා විශ්වාසය වැඩිදියුණු කිරීමට දායක විය.

මනා ඉදිරි දැක්මකින් යුතුව ක්‍රියාත්මක කළ මුදල් ප්‍රතිපත්තිය, දේශීය අංශයේ සැපයුම් තත්ත්වය ඉහළ යෑම මෙන්ම සමාහාර ඉල්ලුම අඩු මට්ටමක පැවතීම හේතුවෙන් රුපියලෙහි සිදු වූ අධික අවප්‍රමාණය සහ දේශීය ඛනිජ තෙල් මිල තීරණය කිරීම සඳහා මිල සූත්‍රයක් හඳුන්වා දීම හමුවේ වුවද වසර තුළදී, මතුපිට හා මූලික උද්ධමනය තනි අඩු අගයක පැවතුණි. 2018 වසර තුළදී පැවතුණු හිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ආහාර බොහොමයක මිල ගණන් පහළ ගිය අතර, මතුපිට උද්ධමනයේ උච්චාවචනයන් ආහාර

කාණ්ඩයේ මිල විචලනයන් හා බෙහෙවින් සමගාමී විය. විශේෂයෙන්ම, ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව තුළ මැදිකාලීන උද්ධමනය මැද තනි අගයක පවත්වා ගැනීමට අපේක්ෂිතය. පහළ මට්ටමක පැවති උද්ධමනය සහ උද්ධමන අපේක්ෂාවන් මෙන්ම ළඟා විය හැකි විභව මට්ටමට වඩා පහළින් පැවති මූර්ත ආර්ථික ක්‍රියාකාරකම් හේතුවෙන් මහ බැංකුවේ දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය අවසන් කරමින් 2018 වසරේ අප්‍රේල් මාසයේදී නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25 කින් අඩු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියා කළේය. ඉන් අනතුරුව, දේශීය ආර්ථිකයේ මන්දගාමී ක්‍රියාකාරිත්වය හමුවේ, විදේශ අංශය කෙරෙහි නොකඩවා ඇති වූ පීඩනය සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මධ්‍යස්ථ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් වසර පුරා පවත්වාගෙන යන ලදී. එහෙත්, විශේෂයෙන්ම 2018 වසරේ සැප්තැම්බර් මාසයේ සිට දේශීය මුදල් වෙළඳපොළේ පැවති අධික හා අඛණ්ඩ ද්‍රවශීලතා හිඟය හේතුවෙන් වාණිජ බැංකුවල සියලු රුපියල් තැන්පතු සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව 2018 නොවැම්බර් මාසයේදී ප්‍රතිශතාංක 1.50 කින් අඩු කරමින්, නිත්‍ය පදනම යටතේ ද්‍රවශීලතාව සැපයීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු විය. එහෙත්, ඒ සමඟම, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව අඩු කිරීමෙන් මධ්‍යස්ථ මුදල් ප්‍රතිපත්තිය මත සිදු වන බලපෑම සමනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති අනුපාතික කොරිඩෝව තවදුරටත් පදනම් අංක 100 දක්වා අඩු කරමින්, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය පදනම් අංක 75 කින්ද, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50 කින්ද, ඉහළ නංවන ලදී. ඒ අනුව, 2018 වසර අවසානයේදී, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින් සියයට 8.00 ක් සහ සියයට 9.00 ක් ලෙස පැවතිණි. 2019 වසරේ මුල් කාලසීමාවේදී දේශීය මුදල් වෙළඳපොළේ ද්‍රවශීලතා හිඟ මට්ටම තවදුරටත් පැවතුණු බැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව 2019 වසරේ මාර්තු මස 01 වැනි දින සිට තවත් ප්‍රතිශතාංක 1.00 කින් සියයට 5.00 ක් දක්වා අඩු කරන ලදී. මේ අතර, බැංකු අංශයේ ශුද්ධ විදේශ වත්කම් ප්‍රමාණය අඩු වීම හේතුවෙන්, 2018 වසරේදී පුළුල් මුදල් සැපයුමේ (M_{2b}) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය අඩු විය. කෙසේ වුවද, පුළුල් මුදල් සැපයුමේ වර්ධනය තුළ, දැඩි ද්‍රවශීලතා හිඟ තත්ත්වයන් හා ඉහළ නාමික හා මූර්ත වෙළඳපොළ පොලී අනුපාතික යටතේ වුවද, වාණිජ බැංකු මගින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණයෙහි සමස්ත ප්‍රසාරණය, 2018 වසරේ අපේක්ෂා කළ මට්ටමට වඩා ඉහළින් පැවතිණි.

මේ අතර, රාජ්‍ය අංශයේ ආදායම් රැස්කිරීමෙහි අඩුවීමක් පැවතිය ද ඉහළ ප්‍රාථමික අතිරික්තයක් සහ පහළ අයවැය හිඟයක් සමඟ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් 2018 වසර තුළදී කිසියම් වැඩිදියුණු වීමක් පෙන්නුම් කළේය. 2018 වසරේදී රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13.3 ක් දක්වා අඩු වූ අතර, විශේෂයෙන්ම වසරේ අවසාන කාලය

තුළ පැවති දේශපාලනික අවිනිශ්චිතභාවයත් සමඟ අයවැය මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ ප්‍රමාදය නිසා රාජ්‍ය ආයෝජන අඩු වීම හේතුවෙන් වියදම් සහ ශුද්ධ ණය දීම් අඩු විය. ආර්ථික කටයුතු මන්දගාමී වීම සඳහා රාජ්‍ය අංශයේ ප්‍රාග්ධන වියදම් අඩු වීම ද දායක විය. රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කෙරෙන වර්තන ගිණුමේ හිඟය 2018 වසරේදී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සැලකීමේදී ඉහළ ගියේය. රාජ්‍ය ආදායම සහ පොලී ගෙවීම් හැර වියදම අතර වෙනස පිළිබිඹු කරන ප්‍රාථමික ශේෂය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේදී වූ සියයට 0.02 ක අතිරික්තයට සාපේක්ෂව 2018 වසරේදී සියයට 0.6 ක අතිරික්තයක් වාර්තා කළේය. ප්‍රාග්ධන වියදම්වල සැලකිය යුතු පහළ යෑම හේතුවෙන් අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේදී පැවති සියයට 5.5 සිට 2018 වසරේදී සියයට 5.3 දක්වා අඩු වුවද, 2018 අයවැයට අනුව අපේක්ෂිත ඉලක්කය වූ සියයට 4.8 ක මට්ටම ළඟා කරගැනීමට නොහැකි විය. මධ්‍යම රජයේ නොපියවූ ණය, 2017 වසර අවසානයට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පැවති සියයට 76.9 සිට 2018 වසර අවසානය වන විට සියයට 82.9 දක්වා වැඩි වූ අතර, ඒ සඳහා විදේශීය ණය ශේෂයේ රුපියල් වටිනාකම මත බලපෑම් කරමින් රුපියල අවප්‍රමාණය වීම, සාපේක්ෂ වශයෙන් පහළ නාමික ද.දේ.නි. සහ අදාළ කාලය තුළ ලබාගත් ඉහළ ශුද්ධ ණය ගැනීම් හේතු විය. ආදායම් පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව උදෙසා පවත්නා අඛණ්ඩ කැපවීම සමඟ ඉදිරි කාලය තුළ රජයේ ණය වගකීම් කළමනාකරණයට පහසුකම් සැලකිය හැකි සක්‍රීය වගකීම් කළමනාකරණ පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය හඳුන්වාදීම මගින් ණය මූල්‍යනය කිරීමේ අවදානම අඩු කළ හැක.

බැංකු අංශයේ සිදුවූ මධ්‍යස්ථ එහෙත් ස්ථාවර වර්ධනය හේතුවෙන් වසර තුළදී මූල්‍ය අංශය අඛණ්ඩව ප්‍රසාරණය විය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන්ම වත්කම්වල ගුණාත්මකභාවයේ පහළ යෑම, මෙහෙයුම් වියදම් ඉහළ යෑම සහ අධික බදු හේතුවෙන් වසර තුළදී බැංකු අංශයේ ලාභදායීත්වය අඩු විය. වසර තුළදී බාසල් III නිර්නායක ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 9 (SLFRS 9) භාවිතය ඇරඹීම ඇතුළුව විචක්ෂණශීලී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වඩාත් ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කටයුතු කරන ලදී. ඒ අතර, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය ද අභියෝගාත්මක පරිසරයක් තුළ මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්බුදකාරී තත්ත්වයන්ට මුහුණ දුන් බලපත්‍රලාභී මුදල් සමාගම් නැවත නගා සිටුවීම සහ එම අංශයේ දිගු කාලයක් පුරා පවතින ගැටලු නිරාකරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී. දේශීය හා විදේශීය වශයෙන් ඇති වූ අහිතකර වර්ධනයන් හේතුවෙන් ආයෝජන විශ්වාසය මත ඇති වූ අයහපත් බලපෑම නිසා කොළඹ කොටස් වෙළඳපොළ මෙම වසරේදී ද දුර්වල කාර්යසාධනයක් වාර්තා කළේය.

පසුගිය වසර කිහිපය තුළ රටෙහි සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වාගෙන යෑමට දැරූ ප්‍රයත්න මධ්‍යයේ වුවද, අත්‍යවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ප්‍රමාදවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය මන්දගාමී වර්ධන මාවතකට පත්ව ඇත. දශකයකට පමණ පෙර මැදි ආදායම් ලබන රටක මට්ටමට පත් වූ ශ්‍රී ලංකාවට 'මැදි ආදායම් උගුල' යන තත්ත්වයෙන් මිදී ඉහළ ආදායම් මට්ටමකට ළඟා වීම සඳහා දූරදර්ශී ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ අවශ්‍ය විය. කෙසේ වුවද, ආර්ථික වර්ධනය සඳහා උපකාර වන ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට සමාන ආර්ථිකයන් පවතින රටවල් ශීඝ්‍ර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර, අපනයන ප්‍රවර්ධනය, විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය, අයවැය හිඟය හා ණය මට්ටම අඩු කර ගැනීම, සාධක වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය, රාජ්‍ය පරිපාලනය ශක්තිමත් කිරීම සහ රටෙහි නීතිය නිසි පරිදි ක්‍රියාත්මක වීම සහතික කිරීම යන අංශවල වර්ධනය කෙරෙහි ඇති බාධා විසඳීමට හා ආර්ථික වර්ධනය දියුණු කිරීමේ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට ඇති ප්‍රමාදයන් ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනය පහළ මට්ටමක පැවතීම සඳහා විශාල වශයෙන් හේතු වී ඇත. එමනිසා, ශ්‍රී ලංකාවට ඉහළ ආදායම් ලබන ආර්ථිකයක් ලෙස සාර්ථකත්වයට පත් වීමට සහ එහි පුරවැසියන්ගේ යහපැවැත්ම වැඩි දියුණු කර ගැනීම සඳහා, ආර්ථිකයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වේගවත් කිරීම තුළින් ආර්ථික වර්ධනය අඛණ්ඩ පහළ අගයක පැවතීමට හේතු වූ කරුණු සඳහා පිළියම් යෙදීම අත්‍යවශ්‍ය වේ. මෙම පසුබිම තුළ, වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ආදායම ඉහළ නැංවීම සඳහා වූ ජාතික අපනයන ක්‍රමෝපාය සහ නව වෙළඳ ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය විනය සහ රාජ්‍ය ණය තිරසාරභාවය පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා වැඩසටහන සහ මිල ස්ථායීතාව තිරසාරව පවත්වා ගැනීම සහතික කිරීම සඳහා 2020 වසර වන විට මහ බැංකුව නම්‍යශීලී උද්ධමනය ඉලක්ක කරගත් ප්‍රතිපත්තියක් පවත්වා ගැනීම ඇතුළත් වන දැනටමත් හඳුන්වා දී ඇති ප්‍රතිසංස්කරණ සැලැස්ම කඩිනම් කිරීම සඳහා සියලුම පාර්ශ්වකරුවන් විසින් ඒකාබද්ධ ප්‍රයත්නයක් දැරීම ඉතා වැදගත් වේ. මෙම ප්‍රතිසංස්කරණ නිසි කලට ස්ථාපිත කිරීම ඉන්දියන් සාගරයේ ආයෝජන සඳහා ඉහළ අවධානයක් ඇති ක්‍රමෝපායික පිහිටීමක් සහිත රටක් ලෙස ශ්‍රී ලංකාවේ ආර්ථික පෙර දැක්ම හා අපේක්ෂාවන් වැඩි දියුණු කිරීම සඳහා පමණක් නොව, රටේ ජනතාවගේ සමස්ත ජීවන තත්ත්වය සහ එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ද අත්‍යාවශ්‍ය වේ. ශ්‍රී ලංකාව මැදිකාලීව ඉහළ හා ස්ථාවර වර්ධන මාවතක් ඔස්සේ ඉදිරියට යෑමට සහ දශක කිහිපයකට පෙර ශ්‍රී ලංකාවට පසුපසින් සිටි රටවල් සමඟ තරගකාරී වීමට නම්, මෙම ප්‍රතිසංස්කරණ තවදුරටත් කල් දැමීම සිදු කළ නොහැක.

සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය (2014-2018)

දර්ශකය	ඒකකය	2014	2015	2016	2017 (අ)	2018 (ආ)
මූර්ත අංශය (ඇ)						
මූර්ත ද.දේ.නි. වර්ධනය	සියයට	5.0	5.0	4.5 (අ)	3.4 (ආ)	3.2
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.	රුපියල් බිලියන	10,361	10,951	11,996 (අ)	13,418 (ආ)	14,450
ඒක පුද්ගල ද.දේ.නි. (ඈ)	එ.ජ. ඩොලර්	3,819	3,842	3,886 (අ)	4,104 (ආ)	4,102
විදේශීය අංශය						
වෙළඳ ශේෂය (ඇ)	ද.දේ.නි.යේ % වශයෙන්	-10.4	-10.4	-10.8 (අ)	-10.9	-11.6
ජංගම ගිණුමේ ශේෂය (ඇ)	ද.දේ.නි.යේ % වශයෙන්	-2.5	-2.3	-2.1	-2.6	-3.2
සමස්ත ශේෂය	එ.ජ. ඩොලර් මිලියන	1,369	-1,489	-500	2,068	-1,103
විදේශීය නිල සංචිත	එ.ජ. ඩොලර් මිලියන	8,208	7,304	6,019	7,959	6,919
රාජ්‍ය මූල්‍ය අංශය (ඇ) (ඉ)						
වර්තන ගිණුමේ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-1.2	-2.3	-0.6	-0.7	-1.2
ප්‍රාථමික ගිණුමේ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-1.5	-2.9	-0.2	0.02	0.6
සමස්ත අයවැය ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-5.7	-7.6	-5.3	-5.5	-5.3
මධ්‍යම රජයේ ණය	ද.දේ.නි.යේ % වශයෙන්	71.3	77.7	78.3	76.9	82.9
මුදල් අංශය සහ උද්ධමනය						
පුළුල් මුදල් වර්ධනය (M_{2b}) (ඊ)	සියයට	13.4	17.8	18.4	16.7	13.0
පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය (M_{2b} හි) (අ)(ඊ)	සියයට	8.6	25.0	21.6	14.7	15.9
වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය (උ)	සියයට	3.3	2.2	4.0	6.6	4.3

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඈ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඉ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 මාර්තු 19 දින නිකුත් කරන ලද 2016 සහ 2017 සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඊ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය
(උ) 2014 වසර සඳහා දත්ත කො.පා.මි. දර්ශකය (2006/07=100) මත පදනම් වන අතර, 2015 සිට දත්ත කො.පා.මි. දර්ශකය (2013=100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුව (අ)

දර්ශකය	ඒකකය	2017 (ආ)	2018 (ඇ)	පුරෝකථන				
				2019	2020	2021	2022	2023
මූර්ත අංශය (ඈ)								
මූර්ත ද.දේ.නි. වර්ධනය	සියයට	3.4 (ඈ)	3.2	4.0	4.5	5.0	5.0	5.0
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.	රුපියල් බිලියන	13,418 (ඈ)	14,450	15,855	17,389	19,170	21,131	23,297
ඒක පුද්ගල ද.දේ.නි.	එ.ජ. ඩොලර්	4,104 (ඈ)(ඉ)	4,102	4,001	4,262	4,530	4,816	5,122
මුළු ආයෝජන	ද.දේ.නි.යේ % වශයෙන්	28.8 (ඈ)(ඊ)	28.6	29.1	29.6	30.1	30.6	31.1
දේශීය ඉතිරිකිරීම්	ද.දේ.නි.යේ % වශයෙන්	21.7 (ඈ)(ඊ)	21.2	22.9	23.9	25.1	26.7	28.4
ජාතික ඉතිරිකිරීම්	ද.දේ.නි.යේ % වශයෙන්	26.2 (ඈ)(ඊ)	25.4	26.8	27.5	28.1	28.8	30.1
විදේශීය අංශය								
වෙළඳ පරතරය (ඈ)	ද.දේ.නි.යේ % වශයෙන්	-10.9	-11.6	-11.6	-11.5	-11.2	-10.6	-9.9
අපනයන	එ.ජ. ඩොලර් මිලියන	11,360	11,890	12,935	14,075	15,390	16,875	18,557
ආනයන	එ.ජ. ඩොලර් මිලියන	20,980	22,233	23,070	24,825	26,620	28,250	29,891
ජංගම ගිණුමේ ශේෂය (ඈ)	ද.දේ.නි.යේ % වශයෙන්	-2.6	-3.2	-2.3	-2.1	-2.0	-1.8	-1.0
විදේශීය නිල සංචිත	ආනයනික මාස වශයෙන්	4.6	3.7	4.1	4.3	4.5	4.7	4.8
රාජ්‍ය මූල්‍ය අංශය (ඈ) (උ)								
සමස්ත ආදායම් සහ ප්‍රදාන	ද.දේ.නි.යේ % වශයෙන්	13.7 (ඌ)	13.4	15.1	16.1	16.8	17.0	17.5
වියදම් හා ශුද්ධ ණය දීම්	ද.දේ.නි.යේ % වශයෙන්	19.2 (ඌ)	18.6	19.5	19.6	20.3	20.5	20.7
වර්තන ගිණුමේ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-0.7 (ඌ)	-1.2	0.2	1.1	1.7	1.8	2.2
ප්‍රාථමික ගිණුමේ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	0.02 (ඌ)	0.6	1.5	2.4	2.5	2.5	2.8
සමස්ත අයවැය හිඟය	ද.දේ.නි.යේ % වශයෙන්	-5.5 (ඌ)	-5.3	-4.4	-3.5	-3.5	-3.5	-3.2
මධ්‍යම රජයේ ණය	ද.දේ.නි.යේ % වශයෙන්	76.9 (ඌ)	82.9	82.6	81.0	75.0	72.0	70.0
මුදල් අංශය සහ උද්ධමනය								
පුළුල් මුදල් වර්ධනය (M_{2b}) (එ)	සියයට	16.7	13.0	12.0	12.5	12.5	12.5	12.5
පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය (M_{2b} හි) (එ)	සියයට	14.7	15.9	13.5	13.3	13.7	13.6	13.5
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (ඒ)	සියයට	6.6	4.3	4.8	5.0	5.0	5.0	5.0

(අ) 2019 මාර්තු මස අවසානය වනවිට පැවති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඉ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඊ) 2017 වසර සඳහා ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස, පිළිවෙළින්, 36.5%, 29.3% සහ 33.9% ක් වූ මුළු ආයෝජන, දේශීය ඉතිරිකිරීම් සහ ජාතික ඉතිරිකිරීම් පිළිබඳ දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරන ලදී.
(උ) මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව 2019 වසරේ තුන්වන කාර්තුව තුළදී සංශෝධනය වනු ඇත.
(ඌ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 මාර්තු 19 දින නිකුත් කරන ලද 2017 සංශෝධිත ද.දේ.නි ඇස්තමේන්තු මත පදනම් වේ.
(එ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය
(ඒ) කො.පා.මි. දර්ශකය (2013 = 100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

ද.දේ.නි.යෙහි වර්ධනය සඳහා ආංශික දායකත්වය



ඉතිරිකිරීම්, ආයෝජන හා ඉතුරුම් - ආයෝජන පරතරය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



සේවා වියුක්ති අනුපාතිකය



මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය)



ගෙවුම් තුලනය



දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත්වීම හා විනිමය අනුපාතිකය



රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයෙහි සාරාංශය
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මධ්‍යම රජයේ ණය
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතික



පුළුල් මුදල් වර්ධනය හා තුඩුදුන් සාධක



වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය



2018 මහ බැංකු වාර්ෂික වාර්තාවෙන් ලබා ගත් රූපසටහන්





ජාත්‍යන්තර වෙළඳපොළ තෙල් මිල ගණන්
දෙසැම්බර් 17
මාර්තු 18
ජූනි 18
සැප්තැම්බර් 18
දෙසැම්බර් 18
මාර්තු 19
ලං.ඛ.නී.සං. හි ඛනිජ තෙල් නිෂ්පාදන
සඳහා මිල සූත්‍රයක් හඳුන්වා දෙන ලදී.
අංශ අනුව
ලං.ඛ.නී.සං. හි ඛනිජ තෙල් අලෙවිය
(ලීටර් මිලියන)
ගෘහස්ථ
281
(29% වාර්ෂික ලක්ෂ්‍යමය)
ගුවන් සේවා
631
(9% වාර්ෂික ලක්ෂ්‍යමය)
කර්මාන්ත
162
(13% වාර්ෂික ලක්ෂ්‍යමය)
බලශක්ති නිෂ්පාදනය
866
(-34% වාර්ෂික ලක්ෂ්‍යමය)
අපනයන
126
ප්‍රවාහන
3,552
(6% වාර්ෂික ලක්ෂ්‍යමය)
පෙට්‍රල් 95
128 148 155 157 161 169 164 159 149 147 152 159
පෙට්‍රල් 92
117 137 145 149 155 145 140 135 125 123 129 132
සුපිරි ඩීසල්
110 119 129 130 133 141 136 131 121 118 126 134
සුදු ඩීසල්
95 109 118 123 116 111 106 101 99 103 104
භූමිතෙල්
44 101 70
ජනවාරි 17
මැයි 18
ජූලි 18
ඔක්තෝබර් 18
දෙසැම්බර් 18
මාර්තු 19
පිරිපහදු කළ නිෂ්පාදන (2,937)
පිරිපහදු කළ නිෂ්පාදන ආනයනය සියයට 19.3 කින් ඉහළ ගියේය.
බොරතෙල් (978)
බොරතෙල් ආනයනය සියයට 38.9 කින් ඉහළ ගියේය.
ගල් අඟුරු ආනයනය සියයට 9.5 ක සෘණ වර්ධනයක් වාර්තා කළේය.
ගල් අඟුරු (237)
එල්.පී. ගෑස් (266)
එල්.පී. ගෑස් ආනයනය සියයට 14 ක වර්ධනයක් වාර්තා කළේය.
පොසිල ඉන්ධන ආනයනය (වටිනාකම, එ.ජ. ඩොලර් මිලියන)



2018 වසර තුළදී සාමාන්‍ය අධ්‍යාපනය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති හා ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.
අධ්‍යාපනය සඳහා රජයේ වියදම 2018 වසරේදී රු.බිලියන 267.6ක් දක්වා වැඩි විය.
අධ්‍යාපනය සඳහා ගෘහස්ථ පරිභෝජනය රු.බිලියන 118.9 දක්වා සියයට 9.8 කින් ඉහළ ගියේය.
ප්‍රාථමික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය 2018 වසරේදී 91.8 වූ අතර, එය 2017 වසරේදී 93.9 විය*.
ද්විතීයික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය 2018 වසරේදී 93.5 වූ අතර, එය 2017 වසරේදී 95.8 විය*.
2017 වසර වන විට සාක්ෂරතාව
92.6%
සාමාන්‍ය අධ්‍යාපනය
ශිෂ්‍ය/ගුරු අනුපාතය
රජයේ පාසල්
17
වෙනත් පාසල්*
15
මිලියන 4.2
රජයේ පාසල්වල සිසුන් සංඛ්‍යාව
199 දහසක්
වෙනත් පාසල්වල සිසුන් සංඛ්‍යාව*
විශ්වවිද්‍යාල අධ්‍යාපනය
සිසුන් සංඛ්‍යාව
94,681
විශ්වවිද්‍යාලවල
61,150
තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය
24,453
විවෘත විශ්වවිද්‍යාලවල
3,633
උසස් අධ්‍යාපන ආයතනවල**
සෞඛ්‍ය අංශය පුළුල් කිරීම සඳහා රජය 2018 වසරේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය.
හෙද සේවක සංඛ්‍යාව
36,165
සෑම 599 දෙනෙක් සඳහා එක් හෙද සේවකයෙක්***
වෛද්‍යවරු සංඛ්‍යාව
20,947
සෑම 1,035 දෙනෙක් සඳහාම එක් වෛද්‍යවරයෙක්***
රජයේ රෝහල් සංඛ්‍යාව
613
ලියාපදිංචි පෞද්ගලික රෝහල් සංඛ්‍යාව
200
පෞද්ගලික අංශය සෞඛ්‍ය සේවා සැපයීම සඳහා අඛණ්ඩ වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.
ලියාපදිංචි ආයුර්වේද රෝහල් සංඛ්‍යාව
109
ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරු සංඛ්‍යාව
25,431
රෝහල්වල ඇඳන් සංඛ්‍යාව
රජයේ
76,744
පෞද්ගලික
5,120
ආයුර්වේද
4,365
* ජාත්‍යන්තර පාසල් හැර
** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂයපථයට අයත් ආයතන
*** රජයේ


නිතර මිල උච්චාවචනය වන ආහාර
නැවුම් මත්ස්‍ය
පොල්
සහල්
එළවළු
අනෙකුත් ආහාර
කිරිපිටි
පරිප්පු
සීනි
පාන්
ආහාර
පාරිභෝගික මිල දර්ශක
ආහාර නොවන
පරිපාලිත අයිතම
ඉන්ධන
බස් ගාස්තු
එල්.පී. ගෑස්
දුම්රිය ගාස්තු
අනෙකුත්
අධ්‍යාපන
සෞඛ්‍ය
පිළියෙල කරන ලද ආහාර
නාමික වැටුප්
රාජ්‍ය අංශය
0.1%
විධිමත් පෞද්ගලික අංශය
0.6%
අවිධිමත් පෞද්ගලික අංශය
13.2%
ජනගහනය
මිලියන 21.67
අවුරුදු 60 සහ ඊට ඉහළ
12.4%
අවුරුදු 0 - 14
25.2%
අවුරුදු 15 - 59
62.4%
සේවා
46.6%
කර්මාන්ත
27.9%
කෘෂිකර්මාන්ත
25.5%
මිලියන 8.02
සේවා නියුක්ත
ශ්‍රම බලකාය
(ආර්ථික වශයෙන් සක්‍රිය)
මිලියන 5.46
ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය: 73%
මිලියන 2.92
ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය: 34%
ස්ත්‍රී/පුරුෂභාවය
ස්ත්‍රී
පුරුෂ
වයස
15-24
25-29
30-39
40+
මිලියන 0.37
සේවා වියුක්ත
සේවා වියුක්ති අනුපාතිකය: 4.4%
අධ්‍යාපන මට්ටම
2.9
6-10 වසර
අ.පො.ස. (සා. පෙළ)
අ.පො.ස. (උ. පෙළ)
ශ්‍රම බලකාය
(ආර්ථික වශයෙන් සක්‍රිය නොවන)
මිලියන 7.81
විදේශ රැකියා සඳහා පිටව යෑම්
අනෙකුත්
13%
32%
පුහුණු ශ්‍රමික
24%
නිපුණතා රහිත ශ්‍රමික
විදේශ රැකියා සඳහා සමස්ත පිටව යෑම්
මිලියන 0.21

ශ්‍රම වෙළඳපොළ තොරතුරු - 2018



දේශීය සහ විදේශීය සාධක හේතුවෙන් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය 2018 වසරේදී දැඩි පීඩනයකට ලක්විය...

2018 වසරේදී වෙළඳ හිඟය පුළුල් විය.



අපනයනවල ධනාත්මක වර්ධනයක් පැවතිය ද වාහන, ඉන්ධන සහ රත්‍රන් ආනයන වියදම හේතුවෙන් වෙළඳ ගිණුමේ හිඟය 2018 වසරේ පළමු කාර්තු තුන තුළදී පුළුල් විය...

එහි ප්‍රතිඵලයක් ලෙස, ජංගම ගිණුමේ හිඟය පුළුල් විය.



සංචාරක ඉපැයීම් වලින් වූ ඉහළම ලැබීම් ද තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සහ ප්‍රවාහන යන අංශවල ස්ථාවර වර්ධනය ද, සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය ස්ථාවරව පැවතීම හමුවේ වුවද 2018 වසරේදී ජංගම ගිණුමේ හිඟය පුළුල් විය.

මේ අතර, මූල්‍ය ගිණුම වෙත සැලකිය යුතු ඉහළ ලැබීම් වාර්තා විය.

හිමිකම් කොටස් වෙත ලැබීම්	හිමිකම් කොටස් වෙතින් වූ ගෙවීම්	ණය ලැබීම්	ණය ගෙවීම්
විදේශ සෘජු ආයෝජන එ.ජ.ඩො. බිලියන 2.1	විවිධ ආයෝජන එ.ජ.ඩො. මිලියන 4	ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර එ.ජ.ඩො. බිලියන 2.5	රාජ්‍ය ණය එ.ජ.ඩො. බිලියන 1.8
		රාජ්‍ය ණය එ.ජ.ඩො. බිලියන 2.3	බැංකු අංශයේ බැඳුම්කර එ.ජ.ඩො. බිලියන 1.35
		ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම එ.ජ.ඩො. මිලියන 252	රාජ්‍ය සුරැකුම්පත් එ.ජ.ඩො. බිලියන 1.0

ඉහළ ණය ආපසු ගෙවීම් සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ ගෙවීම් හමුවේ වුවද, හිමිකම් කොටස් සහ ණය වශයෙන් වූ සැලකිය යුතු ලැබීම් හේතුවෙන් මූල්‍ය ගිණුම ශක්තිමත් විය.

මෙම ප්‍රවණතා හමුවේ, ආනයන සීමා කිරීමට ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් 2019 වසර ආරම්භයේදී විදේශීය අංශය ශක්තිමත් විය.

ආනයන ස්ථාවරව පවත්වා ගැනීමට සහ විනිමය අනුපාතිකය මත ඇතිවන පීඩනය වැළැක්වීමට ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක්ම ගන්නා ලදී...

වාහන

2018 සැප්.	: එ.ජ.ඩො. මිලියන 138
2018 ඔක්.	: එ.ජ.ඩො. මිලියන 161
2018 නොවැ.	: එ.ජ.ඩො. මිලියන 105
2018 දෙසැ.	: එ.ජ.ඩො. මිලියන 77
2019 ජන.	: එ.ජ.ඩො. මිලියන 50

රත්‍රන්

2018 ජන. - අප්‍රේල් එ.ජ.ඩො. මිලියන 437

2018 මැයි - දෙසැ. එ.ජ.ඩො. මිලියන 1

2019 ජන. එ.ජ.ඩො. මිලියන 0.1

එහි ප්‍රතිඵලයක් ලෙස, වාහන සහ රත්‍රන් ආනයන සැලකිය යුතු ලෙස අඩුවීම හේතුවෙන් 2018 වසර අවසානයේදී සහ 2019 වසර මුල් කාලයේදී වෙළඳ හිඟය අඩු විය.

මෙම ප්‍රවණතා හමුවේ විදේශීය අංශය මත ඇති වූ පීඩනය අඩු වූ අතර, 2019 මාර්තු අග වන විට ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අතිප්‍රමාණය විය.





2018 - රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය මිශ්‍ර කාර්ය සාධනයක් පෙන්වීය
ආදායම සහ ප්‍රදාන
13.4
(13.7)
ආදායම් බදු
2.1
(2.0)
අනෙකුත් බදු
2.5
(2.6)
එකතු කළ අගය මත බදු
3.2
(3.3)
නිෂ්පාදන බදු
3.4
(3.5)
බදු නොවන
1.4
(1.2)
ආනයන බදු
0.7
(1.0)
ප්‍රදාන
0.1
(0.1)
වියදම්
18.6
(19.2)
පොලිය
5.9
(5.5)
වැටුප් සහ වේතන
4.3
(4.4)
ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණයදීම
4.2
(4.8)
අනෙකුත්
2.4
(2.6)
විශ්‍රාම වැටුප්
1.5
(1.5)
සමෘද්ධි
0.3
(0.3)
පොහොර සහනාධාර
0.2
(0.2)
14.5
(14.4)
පුනරාවර්තන වියදම
ආදායම පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ස්ථායීතාවය
ප්‍රධාන කරුණු
ප්‍රතිපත්ති රාමු
- නව දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීම
- සක්‍රීය වගකීම් කළමනාකරණ පනත නීතිගත කිරීම
2018
(2017)
(ද.දේ.නි ප්‍රතිශතයක් ලෙස)
රාජ්‍ය මූල්‍ය ශේෂ
2018
0.6
-1.2
-5.3
ප්‍රාථමික ශේෂය
වර්තන ගිණුම් ශේෂය
සමස්ත අයවැය ශේෂය
අය වැය හිඟය මූල්‍යනය
බැංකු නොවන
2.3
(0.8)
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර
2.7
(1.7)
මහ බැංකුව
1.7
(-1.4)
විදේශ ව්‍යාපෘති ණය
0.1
(0.0)
වාණිජ බැංකු
-0.9
(2.8)
අනෙකුත් ණය
0.5
(1.6)
දේශීය මූල්‍යනය (රු.බිලියන)
437.2
(294.3)
විදේශීය මූල්‍යනය (රු.බිලියන)
323.5
(439.2)
2018
82.9%
10.8%
2017
76.9%
9.0%
මධ්‍යම රජයේ ණය / ණය සේවාකරණ ගෙවීම් (ද.දේ.නි)
දේශීය ණය(අ) (රු.බිලියන) 6,018
විදේශීය ණය(අ) (රු.බිලියන) 5,960
(අ) 2018 වසර අග දී
2019 - අයවැය
ආදායම් යෝජනා (බදු හා බදු නොවන)
වාහන සඳහා බදු
දුම්වැටි සඳහා බදු
ESC
ආර්ථික සේවා ගාස්තු
මත්පැන් සඳහා බදු
ප්‍රදාන
බදු ආදායම්
බදු නොවන ආදායම්
වැටුප් සහ වේතන
රාජ්‍ය ආයෝජන
පොලී ගෙවීම්
වියදම් යෝජනා
V2025 ENTERPRISE SRI LANKA
අධ්‍යාපන
නිවාස යෝජනා ක්‍රම
නගර සංවර්ධන
සෞඛ්‍ය
ගමනාගමනය
වැටුප් හා වේතන
මැදිකාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක අභියෝගාත්මකය(ආ)
රාජ්‍ය මූල්‍ය ශේෂ (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)
වර්තන ගිණුමේ ශේෂය
-1.2
0.2
1.1
1.7
1.8
2.2
2018
2019
2020
2021
2022
2023
සමස්ත අයවැය ශේෂය
2018
2019
2020
2021
2022
2023
-5.3
-4.4
-3.5
-3.5
-3.5
-3.2
ප්‍රාථමික ශේෂය
0.6
1.5
2.4
2.5
2.5
2.8
2018
2019
2020
2021
2022
2023
මධ්‍යම රජයේ ණය /රාජ්‍ය ණය
91.2
89.0
87.0
82.0
77.0
72.0
2018 82.9
2019 83.0
2020 81.0
2021 75.0
2022 72.0
2023 70.0
(ආ) මැදිකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව 2019 වසරේ තුන්වන කාර්තුව තුළ දී සංශෝධනය වනු ඇත.



ශ්‍රී ලංකා මහ බැංකුව 2015 වසරේ අවසානයේ සිට ක්‍රියාත්මක කළ
දැඩි මුදල් ප්‍රතිපත්ති කාලසීමාව 2018 අප්‍රේල් මාසයේ සිට අවසන් කළ අතර
වසරේ ඉතිරි කාලය තුළ දී
මධ්‍යස්ථ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වාගෙන ගියේය
2015
2016
2017
2018
2018 වසරේ පහළ උද්ධමනයක්
අඩු ආර්ථික වර්ධනයක්
2018 පළමු මාස 5 තුළ දී ද්‍රවශීලතා අතිරික්තයක්
2018 අප්‍රේල්
නිත්‍ය ණය පහසුකකම් අනුපාතිකය 8.5% දක්වා අඩු කරන ලදී.
දැඩි ගෝලීය මූල්‍ය තත්ත්වයන්
නැගී එන ආර්ථිකයන්ගේ ප්‍රාග්ධන ගලා යෑම්
ජාත්‍යන්තර වෙළඳපොළ තුළ බනිජ තෙල් මිල ඉහළ යෑම්
ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 6.0% දක්වා අඩු කරන ලදී.
නි.තැ.ප.අ. 8.0% දක්වා සහ නි.ණ.ප.අ. 9.0% දක්වා වැඩි කරන ලදී.
2018 නොවැම්බර්
ඉහළ නාමික හා මූර්ත පොලී අනුපාතික
උද්ධමනය
ජා.පා.මි.ද. (2013-100)
7.3% 2018
2017 0.4%
කො.පා.මි.ද. (2013-100)
7.1% 2018
2017 2.8%
(වසර අවසානයේදී, වාර්ෂික ලක්ෂ්‍යමය)
2017 16.7%
2018 13.0%
මුදල් සැපයුමේ වර්ධනය
2018 සැප්තැම්බර් මාසයේ සිට වෙළඳපොළ තුළ අඛණ්ඩ ද්‍රවශීලතා හිඟයක් පැවතිණි
2019 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 5.0% දක්වා අඩු කරන ලදි
2019 පෙබරවාරි
2018 15.9%
2017 14.7%
පෞද්ගලික අංශය සඳහා ලබාදුන් ණය
2018 40.7%
2017 4.5%
රාජ්‍ය සංස්ථා සඳහා ලබාදුන් ණය
2018 16.0%
2017 10.0%
රජයට ලබාදුන් ණය
2020 වසර වන විට නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත නැඹුරුවීමේ ක්‍රියාවලියේ සැලකිය යුතු ප්‍රගතියක් ළඟා කරගෙන ඇත
6%
මැදි තනි අගයක උද්ධමන ඉලක්කයක්
4%


ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය
15.1 %
සමස්ත වත්කම්වල වාර්ෂික වර්ධනය
14.6%
සමස්ත වත්කම්වලට ද්‍රවශීල වත්කම් අනුපාතය
25.7 %
බැංකු
වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර)
1.8 %
බලපත්‍රලාභී බැංකු සංඛ්‍යාව
33
දළ අක්‍රීය ණය අනුපාතය
3.4 %
බැංකු අංශය ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා මට්ටම අවම නියාමන අවශ්‍යතාවයන්ට වඩා ඉහළ අගයක පවත්වා ගනිමින් මධ්‍යස්ථ වර්ධනයක් පෙන්වන ලදී.
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය
11.2%
සමස්ත වත්කම්වල වාර්ෂික වර්ධනය
5.6 %
සමස්ත වත්කම්වලට ද්‍රවශීල වත්කම් අනුපාතය
7.6 %
බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්
වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර)
2.7 %
බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සංඛ්‍යාව
48
දළ අක්‍රීය ණය අනුපාතිකය
7.7%
බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය ණය වර්ධනය හා ලාභදායිතාව මන්දගාමී වීමත්, වත්කම්වල ගුණාත්මකභාවයේ පහත වැටීමත් හේතුකොට ගෙන මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කරන ලදී.
බැංකු අංශය
62 %
සේවක අර්ථසාධක අරමුදල සහ වෙනත් විශ්‍රාම අරමුදල්
15 %
මහ බැංකුව
10 %
බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්
8 %
රක්ෂණ අංශය
3 %
වෙනත්
2 %
සාමාජික ගිණුම් සඳහා ගෙවූ පොලී අනුපාතිකය
9.5 %
සමස්ත වත්කම්වල වාර්ෂික වර්ධනය
10.8 %
ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය
10.4 %
සේවක අර්ථසාධක අරමුදල
සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන)
18.5
ප්‍රතිගෙවුම් (රු. බිලියන)
108
දායකත්වය (රු. බිලියන)
145
සේවක අර්ථසාධක අරමුදල සාමාජිකයින්ට සැලකිය යුතු ප්‍රතිලාභ අනුපාතිකයක් ලබා දෙමින් මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කරන ලදී.
රක්ෂණ සමාගම් සංඛ්‍යාව
26
සමස්ත වත්කම්වල වාර්ෂික වර්ධනය
7.4 %
රක්ෂණ තැරැව්කාර සමාගම් සංඛ්‍යාව
63
රක්ෂණ
වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය
දිගුකාලීන 4.9%
සාමාන්‍ය 5.4%
දළ ලියා හළ වාරිකයන්හි වාර්ෂික වර්ධනය
12.6 %
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය
දිගුකාලීන 312 %
සාමාන්‍ය 204 %
රක්ෂණ අංශයේ සමස්ත දළ ලියා හළ වාරිකයන්හි සියයට 12.6 ක වර්ධනයක් වාර්තා කරන ලදී.